රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/96

මගේ අංකය :- IV-2/9/361/10(එච්)
ආයතන අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1996.03.01

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම, එම අභියාචනා විභාග කිරීම සහ නියෝග දීම.**

ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත.

(1) දැනට පවතින 17:4 වගන්තිය මුළුමනින්ම ඉවත් කරනු ලබන අතර, පහත සඳහන් ඡේද මින්මතු ආයතන සංග්‍රහයේ 17:4 වගන්තිය ලෙස ක්‍රියාත්මක විය යුතුය.

17:4 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි යම් කමිටුවක් විසින් තම බලතල පවරා ඇති රජයේ නිලධරියෙකු විසින් විනයානුකූල කරුණකට අදාලව දෙන ලද මාරුවීම් නියෝගයක්, සේවයෙන් පහ කිරීම හෝ වෙනත් කිසියම් නියෝගයක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එක් අභියාචනයක් ඉදිරිපත් කිරීමට හානියට පත් නිලධාරියාට හිමිකම් ඇත.

17:4:1 ඉහත සඳහන් අභියාචනය විනය බලධාරියාගේ නියෝගය ලැබී මාස 03 ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාදවීම සම්බන්ධයෙන් සාධාරණ හේතු ඇතොත් මාස 03 කට පසුව හා මාස 06 කට ප්‍රථම ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැකියාවක් ඇත.

17:4:2 යම් අභියාචනයක් පිළිබඳව පැහැදිලි කිරීමක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු කැඳවනු ලබන විට එම පැහැදිලි කිරීම නිසා මූලික පරීක්ෂණයේ සාක්ෂිවලට අහිතකර බලපෑමක් ඇතිවේයැයි පෙනී යන්නේ නම් යම් පැහැදිලි කිරීමක් සඳහා හානියට පත් තැනැත්තාටද ඒ හා සමාන අවස්ථාවක් ලබා දිය යුතුය.

17:4:3 අභියාචනාකරු තවදුරටත් සේවයේ යෙදී නොසිටි නම් අභියාචනය පිලිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය කෙලින්ම අභියාචනාකරුට දැන්විය යුතු අතර, ඔහු සේවයේ යෙදී සිටී නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් දැන්විය යුතුය. එම අවස්ථා දෙකෙහිදීම තීරණයේ පිටපතක් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යැවිය යුතුය.

17:4:4 අභියාචනයක් පිලිබඳ වාර්තා කිරීමේදී අභියාචනයේ කර ඇති ඒ ඒ ප්‍රකාශයක් සම්බන්ධයෙන් විනය බලධාරියා විසින් නිරීක්ෂණ ද ඉදිරිපත් කළ යුතුය. මෙහිලා III උපලේඛණයේ දක්වා ඇති ආකාරයටම එම නිරීක්ෂණ ඉදිරිපත් කළ යුතුය.

17:4:5 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් විසින් තීරණයක් දීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ අමාත්‍ය මණ්ඩලය වෙතය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එහි කමිටුවක් තමන්ගේ තීරණයට විරුද්ධව කරනු ලබන අභියාචනයක් විනිශ්චය සඳහා භාර නොගත යුතුය. ව්‍යාතිරේක වශයෙන් කමිටුවේ අභිමතයන් පාවිච්චි කල යුත්තේ පැරණි තීරණයේ සුළු අඩුපාඩු නිවැරදි කිරීමක් සඳහා පමණි. ඉතිරි අභියාචනා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට යොමු කළ යුතුය.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චෝදනා පත්‍ර සම්බන්ධයෙන් කල පරීක්ෂණවලදී පැමිණිල්ල මෙහෙයවීමට පත් කරනු ලබන නිලධාරීන් විසින් පැමිණිල්ල මෙහෙයවීමේ සිය කාර්යයන්ට අමතරව ක්‍රියාත්මක කිරීම සඳහා, පහත සඳහන් නියෝග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබ ඇත.

(I) එකිනෙක චෝදනාව ගොඩනැගෙන පරිදි සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි හා ලේඛනගත සාක්ෂි යෝග්‍ය පරිදි කාලානුරූපව පෙළගස්වා මෙහෙය විය යුතුය.

(II) විනය පරීක්ෂණය අවසන් වූ දින සිට දින 21 ක් ඇතුළත පැමිණිල්ලේ ලිඛිත සාක්ෂි සම්පිණ්ඩනය පරීක්ෂණ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු බවට වග බලා ගත යුතුය. එක් එක් චෝදනාව සනාථ කෙරෙන බව පෙන්වා දෙමින් ඒ ඒ චෝදනාව පිලිබඳ වාචික හා ලිඛිත සාක්ෂි එම වාර්තාවේ වෙන වෙනම සඳහන් කළ යුතුය.

(III) ඉහත දැක්වෙන පරිදි සිය සාක්ෂි සම්පිණ්ඩනය එවන බව පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරියා පරීක්ෂණය අවසන් වූ වහාම පරීක්ෂණ නිලධාරී තැනට දන්වා සිටිය යුතුය.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය